# පාත්ෆයින්ඩර් පැරැණි භාණ්ඩ සංරක්ෂණයට



එම්.එම්.බී.එල් පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරය දීර්ඝ කාලයක් විවිධ පුද්ගලයන් එකතුකරන ලද චිත්‍ර, කාසි, මුද්දර, පොත් පත්, ඓතිහාසික වැදගත්කමක් ඇති භාණ්ඩ, සිතියම්, සහ පැරැණි ලියැකියැවිලි එකතුවක් සංරක්ෂණය කරන අතර එය සමාජ වගකීමක් වශයෙන් සලකා අනාගත පරපුර උදෙසා කරන සත්කාරයකි. නොබෝදා එයට ඉතා දුර්ලභ මුහුදු සිප්පි හා බෙල්ලන්ගේ කටු එකතුවක් ද ඇතුළත් විය. ප්‍රකට ගැඹුරු මුහුදු කිමිදෙන්නකු වූ ආචාර්ය සේන වික්‍රමසූරිය මහතාගේ එකතුවක් වන අතර ඔහු 1970 ගණන්වල ශ්‍රී ලංකා වරාය සංස්ථාවේ සභාපතිව සිටිය දී තංගල්ල වරාය ඉදිකිරීමට ද මුල් විය. ඔහුගේ අභාවයෙන් පසු නවජීවන පදනම සභාපතිනි කුමරිනී වික්‍රමසූරිය මහත්මිය අතට මෙම එකතුව පත්වූ අතර නොබෝදා ඇය ජීවිතක්ෂයට පත් වීමෙන් පසු අනාගතය උදෙසා සංරක්ෂණය කිරීම පාත්ෆයින්ඩර් සමූහ ව්‍යාපාරය භාරගෙන තිබේ. පෑලියගොඩ පාත්ෆයින්ඩර් ආයතනයේ දැන් ඒවා තැන්පත්කර ඇත. මෙම වටිනා එකතුව එහි නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා නිරීක්ෂණය කරන ලද අවස්ථාව ඡායාරූපයේ දැක්වෙයි. ප්‍රධාන විධායක කේ. බාලසුන්දරම්, පාත්ෆයින්ඩර් පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක සහ භාරකරු නලින්ද විකුම්ප්‍රිය මහත්වරු ද එම අවස්ථාවට සහභාගී වූහ.

**ගාමිණී සරත් ගොඩකන්ද**